*සැ. යු.* - 2019.07.05 වැනි දින පළ වූ අංක 2131 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 2,132 - 2019 ජූලි මස 12 වැනි සිකුරාදා - 2019.07.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 152 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 154 |


*සැ. යු.*-(i) නිවාඩු (සංශෝධන) පනත් කෙටුම්පත 2019 ජුනි මස 28 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) ශ්‍රී ලංකා වරලත් ප්‍රවාහන ආයතනය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත 2019 ජුනි මස 28 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 අගෝස්තු මස 02 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 ජූලි මස 19 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


151- B 081541 - 353 (2019/07)
E -1

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

ඇමුණුම 09

## ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

උතුරු මැද පළාත් සභාවේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් අසංක රත්නායක වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1999.08.18 දින ප්‍රධානය කර ඇති අංක අනු/නො/ප්‍ර/2508 දරන ප්‍රධාන පත්‍රයේ හිමිකරුවන නොච්චියාගම, ඉහළවැටියාව පදිංචි පුංචි හේවගේ පැන්ටිස් අප්පු වෙත ප්‍රධානය කොට අනුරාධපුර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 2728 යටතේ 2000.05.10 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්ථා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳ යම් විරෝධතාවයක් ඇත්නම් එය 2019.08.09 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම්දිය යුතුය.

එකී උපලේඛනය

අනුරාධපුර පරිපාලන දිස්ත්‍රික්කයේ, නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උතුරුවිලච්චිය/කෝරළේ අංක 337 මුදිතාගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ඉහළවැටියාව නැමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, — භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක — දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි — විසින් සම්පාදිත අංක — සම්පාදිත අංක දරන කට්ටි කැඩීමේ පිඹුරේ — විසින් සම්පාදිත අංක 703 දරන රේඛා සටහනේ අංක 241 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් අක්කර 01 (එක) රූඩ් — පර්චස් — ක් විශාලත්ව ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ගොඩ ඉඩම

| | | |
|---|---|---|
| *උතුරට* | : | ලොට් 207 |
| *නැගෙනහිරට* | : | ලොට් 205 |
| *දකුණට* | : | ලොට් 210 |
| *බස්නාහිරට* | : | ලොට් 209 |

අසංක රත්නායක,
ප්‍රාදේශීය ලේකම්,
නොච්චියාගම.

2018 දෙසැම්බර් මස 21 වැනි දින.

07-461/3

ඇමුණුම 09

## ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

උතුරු මැද පළාත් සභාවේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ, රාජාංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් පිහිලිඇලේ ගෙදර සුනිල් අබේකෝන් වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1982.08.13 දින ප්‍රදනය කර ඇති අංක අනු/ප්‍ර/5979 දරන ප්‍රදනපත්‍රයේ හිමිකරු වන රාජාංගනය දකුණු ඉවුර යාය 05 පදිංචි පනාකුර ගමරාලලාගේ ජෝන් සිඤ්ඤෝ වෙත ප්‍රදනය කොට අනුරාධපුර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 371 යටතේ 1986.09.30 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳ යම් විරෝධතාවයක් ඇත්නම් එය 2019.08.09 දිනට පෙර මාවෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

උපලේඛනය

උතුරුමැද පළාත අනුරාධපුර දිස්ත්‍රික්කයේ දකුණු නුවරගම් පළාත ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ එප්පාවල කෝරළයේ 7 ඒ ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාසයේ රොටවැව නැමැති ගමේ පිහිටා ඇති, සර්වේ ජනරාල්වයා විසින් සාදනු ලැබ, ඔහු භාරයේ ඇති අංක 04 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක අ.ග.සි.අ. 434 දරන පිඹුරෙහි අංක 468 දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපණය කර ඇති ප්‍රමාණයෙන් අක්කර (නැත) 00 රූඩ් (එකයි) 01 පර්චස් (හත) 07 ක් ඇතියි ගණන් බලා තිබෙන රොටවැව මූකලාන යනුවෙන් හඳුන්වනු ලබන පහත සඳහන් පරිදි මායිම් වූ රජයේ ඉඩම් කට්ටිය :

| | | |
|---|---|---|
| *උතුරට* | : | අංක 399 පාර, |
| *නැගෙනහිරට* | : | අංක 469 ඉඩම, |
| *දකුණට* | : | අංක 479 ඇල රක්ෂිතය. |
| *බස්නාහිරට* | : | අංක 467 ගොඩ ඉඩම. |

පී. ජී. සුනිල් අබේකෝන්,
ප්‍රාදේශීය ලේකම්,
රාජාංගනය.

2019 පෙබරවාරි මස 13 වැනි දින.

07-461/2

ඇමුණුම 09

**ඉඩම් සංවර්ධන ආඥපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි**

උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ, තලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් එන්.එච්.ආර්. නිශාන්ත වන මම, ඉඩම් සංවර්ධන ආඥපනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1982.08.10 දින ප්‍රදානය කර ඇති අංක අනු/ප්‍ර/5450 දරන ප්‍රදානපත්‍රයේ හිමිකරු වන කටියාව ජනපදය පදිංචි පුන්නියාගේ හපු වෙත ප්‍රදානය කොට අනුරාධපුර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ 12/4249 යටතේ 1986.09.09 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳ යම් විරෝධතාවයක් ඇත්නම් එය 2019.08.09 දිනට පෙර මාවෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

උපලේඛනය

අනුරාධපුර පරිපාලන දිස්ත්‍රික්කයේ බටහිර නුවරගම් පළාත දූන් ද. නු. ප. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ එප්පාවල කෝරලේ අංක කටියාව ජනපදය 9 සි ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ කටියාව යාය 02 නමැති ගමේ පිහිටා ඇත්තාවූද අනුරාධපුර ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක — දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි — විසින් සම්පාදිත අංක අයි. එස්. පි. පි. 47 දරන කට්ටි කැඩීමේ පිඹුරේ — විසින් සම්පාදිත අංක — දරන රේඛා සටහනෙහි අංක 55 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද ප්‍රමාණයෙන් අක්කර 00 (නැත) රූඩ් 03 (තුනයි) පර්චස් 31 (තිස් එක) ක් විශාලත්වය ඇත්තාවූද පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ මඩ ඉඩම.

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 45 හා 54න් කොටසක් |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 52, 151, 152 |
| *දකුණට* | : | කැබලි අංක 56 කොටසක් හා 152 කොටසක් |
| *බස්නාහිරට* | : | කැබැලි අංක 56 හා 45 කොටසක් |

එන්. එච්. ආර්. නිශාන්ත,
ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
තලාව.

2019 ජනවාරි මස 30 වැනි දින.

07-461/1

ඇමුණුම 09

මගේ අංකය : 8/3/6/කො.බි/83
2019.01.16 දින,
ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය, මාතලේ.

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදානපත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි**

මධ්‍යම පළාත් සභාවේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් කළහේ පාඩි කෝරාළගේ ලංකා ප්‍රියානී මධුවන්ති වන මම ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ ජනාධිපති විසින් 1982.03.29 දින ප්‍රදානය කර ඇති අංක මාතලේ/ප්‍ර/264 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අංක 30, කොටුවේගෙදර බී ජනපදය, මාතලේ ලිපිනයේ පදිංචි දිසානායක මුදියන්සේලාගේ අප්පුහාමි මහතා වෙත ප්‍රදානය කොට මාතලේ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක මා 1/192 යටතේ 1982.09.30 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2019.07.28 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

උපලේඛනය

මාතලේ පරිපාලන දිස්ත්‍රික්කයේ මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොහොන්සිය පත්තුවේ, කොටුවේගෙදර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ කොටුවේගෙදර නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද,සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත, ඔහු භාරයේ ඇති අංක අයි. 20/4, 5 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක මා/121 දරන පිඹුරේ අංක 30 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් පර්චස් 11 විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද, රජයේ ඉඩම - කොටුවේගෙදර බී ජනපදය.

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 4 (පාර), |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 29(පාර), |
| *දකුණට* | : | කැබලි අංක 4 (පාර), |
| *බටහිරට* | : | කැබලි අංක 31, |

කේ. පී. කේ. එල්. පී. මධුවන්ති,
ප්‍රාදේශීය ලේකම්,
මාතලේ.

2019 ජනවාරි මස 16 වැනි දින.

07-361

ඇමුණුම 09

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදානපත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි**

මධ්‍යම පළාත් සභාවේ, මාතලේ දිස්ත්‍රික්කයේ, ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්/ මාදුවගේ යුරේෂ් නිශාන්ත වන මම ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) වන උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1998.01.20 දින ප්‍රදානය කර ඇති අංක මධ්‍යම/ගලේ/5716 දරන ප්‍රදානපත්‍රයේ හිමිකරුවන තලකිරියාගම, කළුආරච්චිගම පදිංචි කෝදගොඩ ගමගේ විමලසේන වෙත ප්‍රදානය කොට මාතලේ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක මධ්‍යම/ගලේ/5716/653/99 යටතේ 1999.05.19 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම ඇති අයකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2019.08.05 දිනට පෙර මා වෙත ලිඛිතව දනුම් දිය යුතුය.

උපලේඛනය

මාතලේ පරිපාලන දිස්ත්‍රික්කයේ ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කන්දපල්ල/කෝරළේ මීවලපතහ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ මීවලපතහ කළුආරච්චියාගම නැමති ගමේ පිහිටා ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් අක්කර 01 වූ රූඩ් 02, පර්චස් 00 ක් විශාලත්වය ඇත්තාවූද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම, කළුආරච්චිගම.

| | | |
|---|---|---|
| *උතුරට* | : | බුලං ඇල රක්ෂිතය |
| *නැගෙනහිරට* | : | එම්. පී. ජී. ජයසිංහගේ ඉඩම |
| *දකුණට* | : | කේ. ජී අනුලා රාජපක්ෂගේ ඉඩම |
| *බස්නාහිරට* | : | බුලං ඇල රක්ෂිතය |

එම්. යූ. නිශාන්ත,
ප්‍රාදේශීය ලේකම්,
ගලේවෙල.

2019 මාර්තු මස 18 වැනි දින.

07-462

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය* : 4/10/54796
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය* : SPLC/DEV/04/NELL/484

**21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි**

ගාල්ල දිස්ත්‍රික්කයේ නෙළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් 235, පනාගොඩ ග්‍රාම නිලධාරි වසමේ පනාගොඩ ගමේ ජනපද නිලධාරි විසින් අඳින ලද දළ අනුරේඛනයේ දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 0.20369 ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් වාණිජ කටයුතු සඳහා කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ. :

| | | |
|---|---|---|
| *උතුරට* | : | ඩී. එල්. ප්‍රේමවන්ත ගේ ඉඩම |
| *නැගෙනහිරට* | : | අනුරුද්ධිකා අබේතුංග ගේ ඉඩම |
| *දකුණට* | : | ජනක් අබේතුංග ගේ ඉඩම |
| *බටහිරට* | : | නෙළුව දෙල්ලව මාර්ගය |

ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

(*අ*) *බදු කාලය* : අවුරුදු තිහයි. (30) (2019.04.11 දින සිට ඉදිරියට)

*වාර්ෂික බදු මුදල* .- බද්ද ක්‍රියාත්මකවන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000/-) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොල වටිනාකමින් 2% කි. බද්ද ක්‍රියාත්මකවන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොල වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක්ම සංශෝධනය විය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

(*ආ*) බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

(*ඇ*) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

(ඈ) සාද ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යුතුය.

(ඉ) ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලටද මෙම බද්ද යටත් විය යුතුය.

(ඊ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

(උ) 2019.04.11 දින සිට වසර 05ක අවම කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම් කළ නොහැක.

(ඌ) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හිදී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට්* කළ දින සිට සති 06ක් ඇතුළත දී අදළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

ටී. යූ. කේ. සටන්නායක,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් වෙනුවට.

2019 ජුලි මස 12 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර, ''මිහිකතමැදුර'',
ඉඩම් මහලේකම් කාර්යාලයේ අංක 1200/6හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

07-465

---

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය* : 4/10/50172
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය* : NCP/PLC/L6/4/04/කැබි

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

අනුරාධපුර දිස්ත්‍රික්කයේ කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 30 ගලවැව ග්‍රාම නිලධාරී වසමේ අඹකැපුවැව ගමේ දළ අනුරේඛනයේ දැක්වෙන ප්‍රමාණයෙන් පර්චස් 80 ක් වාණිජ කටයුතු සඳහා සාමාන්‍යාධිකාරී ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ.

*උතුරට* : රජයේ ඉඩම
*නැගෙනහිරට* : අයිරාංගනීගේ ඉඩම
*දකුණට* : කණුගහවැවට යන පාර රක්ෂිතය
*බටහිරට* : බුල්ගහවැවට යන පාර රක්ෂිතය

02. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසි වලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

(අ) *බදු කාලය* - අවුරුදු තිහයි. (30) (2017.01.13 දින සිට ඉදිරියට)
*වාර්ෂික බදු මුදල* : ප්‍රධාන තක්සේරුකරුගේ 2017 වර්ෂයේ ඉඩමේ වානිජමය වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අය කළ බදු මුදලින් 50% කට නොඅඩු විය යුතුය.

*වාර මුදල* : වාර්ෂික බදු මුදල මෙන් තුන් ගුණයකි.

(ආ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01 ක් ඇතුළතදී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

(ඇ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

(ඈ) ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසි වලටද මෙම බද්ද යටත් විය යුතුය.

(ඉ) සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

(ඊ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබා ගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බදු දීම අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

(උ) 2017.01.13 දින සිට අවුරුදු 05 ක අවම කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම් කළ නොහැක.

(ඌ) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හිදී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙම නිවේදනය *ගැසට්* පත්‍රයේ පළ කල දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

පුබුදි ප්‍රේමදාස,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට*

2019 ජුලි මස 12 වැනි දින,
''මිහිකත මැදුර'' ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දීය.

07-464

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/41707
මධ්‍යම පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : සීපීසී/එල්සී/එල්ඩී/8/1/14/171

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

මහනුවර දිස්ත්‍රික්කයේ උඩපළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කීරපනේ ග්‍රාම නිලධාරි වසමේ කීරපනේ ගමේ සී. එම්. 320051 පිඹුරේ කැබලි අංක 4.67න් දැක්වෙන පර්. 10ක් වූ රජයේ ඉඩම් කොටස උග්ගල්ලේ පියසිංහ අමිල සුදේහ පියසිංහ මහතා විසින් නේවාසික කටයුතු සඳහා දීර්ඝ කාලීන බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත දැක්වේ.

| | | |
|---|---|---|
| *උතුරට* | : | (කොන්ක්‍රීට් පාර) කැබලි අංක 137 හා කැබලි අංක 223 |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 228 හා 227 ඉතිරි කොටස |
| *දකුණට* | : | කැබලි අංක 229 ඉතිරි කොටස |
| *බටහිරට* | : | කැබලි අංක 127 හා 229 ඉතිරි කොටස |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

| | | | |
|---|---|---|---|
| (අ) | *බදු කාලය* | : | අවුරුදු 30 යි.(2015.05.27 සිට වසර තිහක් ඉදිරියට) |
| | *වාර්ෂික බදු මුදල* | : | ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත, 2015 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4% කි. |
| | *වාර මුදල* | : | වාර්ෂික බදු මුදල මෙන් තුන්ගුණයකි. |

(ආ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුද්දක් ඇතුළත දී පළාත් ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කළ යුතුය.

(ඇ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම නේවාසික කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

(ඈ) පළාත් ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසි වලට ද මෙම බද්ද යටත් විය යුතුය.

(ඉ) සාද ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

(ඊ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක, බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

(උ) 2015.05.27 සිට වසර 05ක් ගත වන තුරු පවුල තුළ පැවරීම් හෝ මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු හෝ පැවරීම් හැර වෙනත් පැවරීම් හා අතුරු බදු දීම සඳහා අවසර දෙනු නොලැබේ.

(ඌ) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙහි පහත සඳහන් දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

ඩබ්. අයෝධ්‍යා එස්. ජයවර්ධන,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2019 ජූලි මස 12 වැනි දින,
1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, මිහිකත මැදුර,
රජමල්වත්ත පාර, බත්තරමුල්ල,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දීය.

07-359

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/55683
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : එන්සීපී/පීඑල්සී/එල්8/11/4

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 340, අඩම්පනේ ග්‍රාම නිලධාරි වසමේ නුගගහවැව ගමේ ජනපද නිලධාරි විසින් සකසන ලද අනුරේඛනයේ කැබලි අංක 01 දරන ප්‍රමාණයෙන් අක්කර 11, පර්චස් 10ක් කෘෂිකාර්මික කටයුතු සඳහා ඉන්ද්‍රා වන්නිනායක මහත්මිය නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත දැක්වේ.

| | | |
|---|---|---|
| *උතුරට* | : | ජේ. රණසිංහ මයාගේ සහ ආර්. කේ. චන්ද්‍රා පද්මිණිගේ සහ ආර්. එම්. ධර්මසේන මයාගේ අනවසර හේන් ඉඩම් |
| *නැගෙනහිරට* | : | ජේ. රණසිංහ මයාගේ සහ ආර්. කේ. චන්ද්‍රා පද්මිණිගේ සහ ආර්. එම්. |

ධර්මසේන මයාගේ අනවසර හේන් ඉඩම්

*දකුණට* : අතුරු පාර රක්ෂිතය, ජේ. සිරියලතා මියගේ, ඩබ්. ඒ. ඩී. සුගතපාල මයාගේ සහ රණසිංහ යන අයගේ අනවසර ඉඩම්

*බටහිරට* : ප්‍රාදේශීය සභා මාර්ග රක්ෂිතය

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

(*අ*) *බදු කාලය* : අවුරුදු තිහ යි.(2018.08.09 දින සිට ඉදිරියට)

(ආ) *වාර්ෂික බදු මුදල* : 2018 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන වන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2018 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 2% කි. 2018 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වැඩිවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

*වාර මුදල* : වාර මුදලක් අය නොකෙරේ.

(*ඇ*) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01 ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

(*ඈ*) බදු ගන්නන් විසින් මෙකී ඉඩම කෘෂිකාර්මික කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

(*ඉ*) ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය.

(*ඊ*) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක, බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

(*උ*) 2018.08.09 දින සිට වසර 05ක් ගත වන තුරු මෙම ඉඩම අතුරු බදු හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ. ඉන්පසු වුව ද, අතුරු බදු හෝ පැවරීම් කළ හැක්කේ මෙම ඉඩම බදුගත් කාරණය සඳහා පමණි.

(*ඌ*) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට්* නිවේදනය පළකරන දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

පුබුදි ප්‍රේමදාස,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2019 ජූලි මස 12 වැනි දින,
1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, මිහිකත මැදුර, රජමල්වත්ත පාර, බත්තරමුල්ල,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දීය.

07-360

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/57448
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : SPLC/GAL/3/3/89

**21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි**

ගාල්ල දිස්ත්‍රික්කයේ තවලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් 228, මල්ගල්ල ග්‍රාම නිලධාරි වසමේ හල්විටිගල ගමේ ජනපද නිලධාරි විසින් අඳින ලද දළ අනුරේඛනයේ දැක්වෙන ප්‍රමාණයෙන් පර්චස් 28ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් වාණිජ කටයුතු සඳහා කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත දැක්වේ. :

*උතුරට* : ආර්. එස්. සෝමදාස ගේ ඉඩම

*නැගෙනහිරට* : ආර්. එස්. සෝමදාස ගේ ඉඩම

*දකුණට* : හල්විටිගල දම්මල මාර්ග රක්ෂිතය සහ ටී. එච්. විලියම් ගේ ඉඩම

*බටහිරට* : ටී. එච්. විලියම් ගේ ඉඩම සහ ආර්. එස්. උපවංශ ගේ ඉඩම

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ. :

(*අ*) බදු කාලය : අවුරුදු තිහ යි.(30) (2019.04.11 දින සිට ඉදිරියට)

වාර්ෂික බදු මුදල : බද්ද ක්‍රියාත්මක වන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල්

මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන වන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොල වටිනාකමින් 2% කි. බද්ද ක්‍රියාත්මකවන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා වැඩිවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොල වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක්ම සංශෝධනය විය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදුමුදලට 20% ක් එකතු විය යුතුය.

(*ආ*) බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

(*ඇ*) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01 ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

(*ඈ*) සාද ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

(*ඉ*) ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය.

(*ඊ*) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක, බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

(*උ*) 2019.04.11 දින සිට වසර 05ක අවම කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම් කළ නොහැක.

(*ඌ*) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට්* නිවේදනය පළකරන දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

ටී. යූ. කේ. සටන්නායක,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2019 ජූලි මස 12 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර, ''මිහිකත මැදුර'',
ඉඩම් මහලේකම් කාර්යාලයේ, අංක 1200/6හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

07-463

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :4/10/54356.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :
එන්සීපී/පීඑල්සී/එල්2/15/04.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 302, කටුකැලියාව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පෙරිමියන්කුලම ගමේ ඉඩම් නිලධාරි විසින් සකසන ලද දළ අනුරේඛනයේ දක්වෙන ප්‍රමාණයෙන් පර්චස් 60ක් පුණ්‍ය කටයුතු සඳහා සසුන හරිමග සම්මන්ත්‍රණ සභාවේ භාරකාර මණ්ඩලය නමින් බදුඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත දැක්වේ.

*උතුරට* : සසුන සෙනසුන භූමිය,
*නැගෙනහිරට* : ගුණදසගේ ඉඩම,
*දකුණට* : මාර්ග රක්ෂිතය,
*බටහිරට* : මාර්ග රක්ෂිතය හා සසුන සෙනසුන භූමිය.

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

(*අ*) *බදු කාලය.*- අවුරුදු තිහයි (30) (2019.04.11 දින සිට ඉදිරියට)

*වාර්ෂික බදු මුදල.*- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2019 වර්ෂයේ ඉඩමේ වෙළෙඳපොළ වටිනාකමින් 1/2% කි.

(*ආ*) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුලත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

(*ඇ*) බදු ගන්නන් විසින් මෙකී ඉඩම පුණ්‍ය කටයුතු සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

(*ඈ*) ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය.

(*ඉ*) සාද ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

(*ඊ*) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියාකරනු ලැබේ.

(*උ*) 2019.04.11 දින සිට වසර පහක් ගතවන තුරු මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහාවන අතුරු බදු හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(ඓ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට්* නිවේදනය පළකරන දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

පුබුදි ප්‍රේමදාස,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2019 ජූලි මස 12 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
''මිහිකත මැදුර'', රජමල්වත්ත පාර, බත්තරමුල්ල,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේදී ය.

07-314

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :-4/10/59303.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : NP/28/04/2/SLO/41/1481.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

යාපනය දිස්ත්‍රික්කයේ වේලනෙයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මන්ඩෙයිතීවු ග්‍රාම නිලධාරි වසමේ මන්ඩෙයිතීවු ගමේ PP No. Ya 2898 අංක දරන පිඹුරේ කැබලි අංක 09 දරන ප්‍රමාණයෙන් හෙක්. 6.0158ක් වූ රජයේ ඉඩම් කොටස වාණිජ කටයුතු සඳහා S. P. Samy Investment Complex (PVT) Limited වෙත බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ.

අංක PP No. Ya 2898 පිඹුරේ කැබලි අංක 9
ප්‍රමාණය : හෙක්. 6.0158

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 5 සහ 8, |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 8 සහ තරවේයි වත්ත, |
| *දකුණට* | : | PPYA 1000 පිඹුරේ කැබලි අංක 2 සහ 3, |
| *බටහිරට* | : | PPYA 1000 කැබලි අංක 3 සහ 1. |

02. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

*(අ) බදු කාලය* : අවුරුදු තිහයි (30) (2019.06.06 දින සිට ඉදිරියට)

*වාර්ෂික බදු මුදල* : බද්ද ක්‍රියාත්මක වන 2019 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. මිලි. 5,000,000) වඩා අඩුවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොල වටිනාකමින් 2%කි. බද්ද ක්‍රියාත්මක වන 2019 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (5,000,000) වැඩිවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොල වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක් ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20%ක් එකතු විය යුතු ය.

*වාර මුදල* : වාර මුදලක් අය නොකෙරේ.

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඈ)* පළාත් ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසි වලට ද මෙම බද්ද යටත්විය යුතුය.

*(ඉ)* සෑද ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බදු දීම අවසන් කිරීම සඳහා ක්‍රියාකරනු ලැබේ.

*(උ)* 2019.06.06 දින සිට අවුරුදු 05 ක අවම කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම් කළ නොහැක.

*(ඓ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*මෙම* නිවේදනය *ගැසට්* පත්‍රයේ පළකරන දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

එස්. ඒ. එරන්තිකා ඩබ්. කුලරත්න,
සහකාර ඉඩම් කොමසාරිස්(ඉඩම්),
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2019 ජූලි මස 12 වැනි දින,
''මිහිකත මැදුර'', ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

07-313

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.